
# හෙළ අභිමන් ජාතික පෙරමුණ

**දළදා වහන්සේ මුල් කරගත් ආධ්‍යාත්මික දේශපාලනයක්**

**බෞද්ධ ආර්ථිකයක්**

# මූලික ප්‍රතිපත්ති
# සහ
# දැක්ම



## 1. ඒකීය ශ්‍රී ලංකාවක් තුළ බුදු දහමට ප්‍රමුඛත්වය

- ✓ ශ්‍රී ලංකාව ස්වාධීන, ස්වෛරී, ඒකීය රාජ්‍යයක් බව අප පිළිගනිමු. දැනට ශ්‍රී ලංකාවේ සියලුම සාම්ප්‍රදායික දේශපාලන පක්ෂ සහ ඒවායේ නායකයන් ඉන්දු පැසිෆික් න්‍යාය පත්‍රයෙහි හෝ එක් තීරයක් - එක් මාවතක් වැඩපිළිවෙලෙහි අතකොළු බවට පත්වූ දේශීය නියෝජිතයන් පමණක්ම වන බැවින් ඔවුන් කිසිවකුගේ මූලිකත්වයෙන් වර්තමානයේ හෝ අනාගතයේදී ගොඩනැගෙන කිසිදු බලවේගයක් හරහා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ඉදිරිපත් කිරීම, පවතින 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනයට ලක් කිරීම, විධායක ජනාධිපති ක්‍රමවේදය අහෝසි කිරීම, විධායක අග්‍රාමාත්‍යධූරයක් ස්ථාපිත කිරීම තුළින් විධායක බලය පාර්ලිමේන්තුවට ලබාදීම වැනි ශ්‍රී ලංකාවේ පාලන ආකෘතිය වෙනස් කිරීමට දරණ ප්‍රයත්නයන් සියල්ලටම අප එකහෙළා විරුද්ධ වෙමු. එමෙන්ම 13 වන ව්‍යවස්ථා සංශෝධනය බලාත්මක කරමින් උතුරු නැගෙනහිරට බලය බෙදීම, සමගාමී ලැයිස්තු අහෝසි කිරීම ආදී ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාවය සහ ඒකීයභාවය තර්ජනයට ලක් කරන සියලුම උත්සාහයන්ටද අප එරෙහි වෙමු.

- ✓ බුදු දහම ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආගම බවත්, බුදු දහම ප්‍රවර්ධනය කොට ආරක්ෂා කිරීම රාජ්‍යයේ අත්හල නොහැකි මූලික වගකීමක් බවත් අප පිළිගනිමු. එමෙන්ම පවතින 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව බුදු දහමට ලබාදී ඇති ප්‍රමුඛත්වයත්, සම්බුද්ධ ශාසනය ආරක්ෂා කිරීමට පවරා ඇති වගකීමත්, අන්‍ය ආගම් වල අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට එහි ලබා දී ඇති පොරොන්දුවත් කඩ කර, රට අනාගමික රාජ්‍යයක් බවට පත් කිරීමට දරණ ප්‍රයත්නයන් සියල්ලටද අප විරුද්ධ වෙමු.

- ✓ ශ්‍රී ලංකාවේ ඓතිහාසික සභ්‍යත්වය බුදු දහම මත පදනම් වී ඇති හෙයින්ද, එම ශිෂ්ටාචාරයේ නිර්මාතෘ ජාතිය සිංහල ජාතිය වන නිසාද, ශ්‍රී ලංකාව අනන්‍යතාවයෙන් සිංහල බෞද්ධ රටක් වශයෙන් අප පිළිගනිමු. එමෙන්ම එම ඓතිහාසික සභ්‍යත්වය ගොඩනැඟීම, පවත්වාගෙන යෑම, ප්‍රවර්ධනය සහ ආරක්ෂාව ලංකා ඉතිහාසය පුරාවට සිංහල ජාතිය විසින් මූලිකවම සිදු කර ඇති හෙයින් ශ්‍රී ලංකාවේ භූමිපුත්‍ර අයිතිය සිංහලයන් සතු කිසිවිටෙකවත් උල්ලංඝණය සහ අභියෝගයට ලක් කළ නොහැකි සුජාත අයිතියක් බවත් අවධාරණය කර සිටිමු.

- ✓ තවද ශ්‍රී ලංකාව බහු ආගමික, බහු සංස්කෘතික රාජ්‍යයක් වුවද මෙරට තුල ඉතිහාසය පුරාවට තිබී ඇත්තේ ඒක සභ්‍යත්වයක් බවත්, එය සිංහල බෞද්ධ සභ්‍යත්වයම පමණක් බවත්, මෙරටෙහි වෙසෙන සියළු ජන කොටස් එම පොදු සභ්‍යත්වයේ කොටස්කරුවන් මිස ඒ ඒ සුළුතර ජන කොටස් වලට අනන්‍යවූ වෙනම සභ්‍යත්වයන් මෙරට ඉතිහාසය තුල කිසි දිනෙක දක්නට නොතිබූ බවත් මෙහිලා අවධාරණය කර සිටිමු.

- ✓ එබැවින් මෙරටෙහි ජනවාර්ගික ගැටළුවක් ඇතැයි යන සාවද්‍ය මතයත්, උතුරු නැගෙනහිර දමිළ ඊළාම් නිජබිම් සංකල්පයත්, නැගෙනහිර වෙනම මුස්ලිම් පරිපාලන දිස්ත්‍රික්කයක ඉල්ලීමත් අප එක හෙළාම ප්‍රතික්ෂේප කරන අතර ශ්‍රී ලංකාව තුල වෙසෙන සිංහල සහ බෞද්ධ නොවන ජනයාගේ විවිධවූ ආගමික සහ සංස්කෘතික භාවිතාවන් මෙන්ම අනන්‍යතාවයන් ආරක්ෂා වන අන්දමින් සිංහල බෞද්ධ මහා සභ්‍යත්වය සමඟ ඔවුන් ඒකාග්‍ර කිරීමේ වැඩපිළිවෙලක් දියත් කළ යුතු බවද අප පිළිගනිමු.

## 2. දළදා වහන්සේ මුල් කරගත් නව ආධ්‍යාත්මික දේශපාලන ක්‍රමවේදයක අවශ්‍යතාවය

- ✓ පශ්චාත් යටත් විජිත යුගය පුරාවටම ශ්‍රී ලංකාව ගෝලීය බලවතුන්ගේ ගොදුරු බිමක් මෙන්ම නූතන යටත් විජිතයක් වශයෙන් තවදුරටත් පවත්වාගෙන යෑම පිණිසම අධිරාජ්‍යවාදීන් විසින් හඳුන්වා දෙන ලද, ගෝලීය බලවතුන්ට පහසුවෙන් අභ්‍යන්තර පාලනයට අත පෙවිය හැකි, දේශපාලකයන්ගේ බලාධිකාරය රැකගැනීම සඳහා ශ්‍රී ලාංකීය ජන සමාජය ජාති, ආගම්, කුල මල, වර්ග, වර්ණ, පක්ෂ, පාට වලට බෙදා වෙන් කෙරෙන ඊනියා ප්‍රජාතන්ත්‍රවාදය, පක්ෂ දේශපාලන ක්‍රමය සහ වෙස්ට්මිනිස්ටර් පාර්ලිමේන්තු සම්ප්‍රදාය යන ත්‍රිත්වයෙන් සැදුම්ලත් මේ බටහිර දේශපාලන ක්‍රමය අප සහමුලින්ම ප්‍රතික්ෂේප කරමු.

- ✓ රටෙහි සමස්ථ ඡන්ද දායකයන්ගෙන් හරි අඩකගේ කැමැත්ත මත පමණක් පාලකයා සහ රජය තෝරා පත් කරන මෙම පාලන ක්‍රමය (සියයට පනහේ ප්‍රජාතන්ත්‍රවාදය) තුළින් කෙතරම් සාර්ථක පාලකයෙක් හෝ සාධනීය වැඩපිළිවෙලක් සහිත රජයක් බිහි වුවද, හුදෙක් පාක්ෂික මානසිකත්වය සහ මනුෂ්‍ය දුර්වලතාවය නිසාම එම පාලන තන්ත්‍රයටත්, වැඩපිළිවෙලටත් හේතු රහිතවූ විරෝධාකල්පයක් සහිතව වෙසෙන, එය කඩාකප්පල් කිරීම සඳහා විජාතික බලවේග සහ විපක්ෂයේ කල්ලි කණ්ඩායම්වල මැදිහත්වීමෙන් ඕනෑම මොහොතක මෙහෙයවිය හැකි ආණ්ඩු විරෝධී මහා ජනතාවක් ඉතිරිවීම මෙම ක්‍රමවේදයේ ප්‍රධාන දුර්වලතාවයක් බව අප දකිමු.

- ✓ එම විරුද්ධ මතධාරී ජනතාව උද්ඝෝෂණ, අරගල, ත්‍රස්ත ක්‍රියා සහ නොයෙකුත් වැරදි තොරතුරු සමාජගත කිරීමේ ව්‍යාපාර හරහා ගොදුරු කරගනිමින්, රජයට විරුද්ධව උසිගන්වා විජාතික බලවේගවල සාහසික න්‍යාය පත්‍රයන් මුදුන්පත් කරගැනීම සඳහා යොදා ගැනීමට හැකි වීම පවතින ක්‍රමවේදයේ ඇති අස්ථාවරභාවය මෙන්ම අසම්පූර්ණ ස්වභාවය පිළිබිඹු කරන අතර එනිසාම මෙම බටහිර දේශපාලන ක්‍රමවේදය ඇතැම් බටහිර රටවලට ගැලපුනද භූදේශපාලනික වශයෙන් බලන කල ශ්‍රී ලංකාවේ පිහිටීම සහ වැදගත්කම සහිත රටකට කිසිසේත්ම නොගැළපෙන බවද අප අවධාරණය කර සිටිමු. එසේම බටහිර රටවල මෙන් සිය ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් පිළිබඳව බෙහෙවින් සවිඥාණිකවූ, ශක්තිමත් මෙන්ම ගුණාත්මක භාවයෙන් ඉහළ සහ ප්‍රමාණයෙන් විශාලවූ මධ්‍යම පන්තියක් මෙරට තුළ නොමැති වීමත්, වසර පහකට වරක් පැමිණෙන මැතිවරණ වලදී සිය ඡන්දය භාවිතා කිරීම හැර සාමාන්‍ය පුරවැසියන්ට රාජ්‍ය යාන්ත්‍රණය හා නිරතුරුව සබඳතා පැවැත්විය හැකි ක්‍රමවේදයක් දැනට පවතින පාලන ආකෘතිය තුළ නොමැතිවීමත්, මෙම පාලන ක්‍රමවේදය ශ්‍රී ලංකාවට තවදුරටත් නොගැළපීමට හේතු සාධක වශයෙන් අප දකිමු.

- ✓ මේ සියලු දුර්වලතාවයන්ගේ සාකල්‍යය බලපෑම නිසා රාජ්‍ය විරෝධී විජාතික බලවේගවල උවමනාවන් මෙරට තුළට ඉතා පහසුවෙන් සන්නයනය කෙරෙන පවතින බහු පක්ෂ දේශපාලන ක්‍රමය මෙන්ම සියයට පනහේ ප්‍රජාතන්ත්‍රවාදය සහ මන්ත්‍රීවරුන් මුදලට පිල් මාරු කරන වගකීම් හා වගවීම් විරහිත වෙස්ට්මිනිස්ටර් පාර්ලිමේන්තු සම්ප්‍රදාය ශ්‍රී ලංකාවට කිසිසේත්ම නොගැළපෙන බවත්, මෙරටට වඩාත්ම උචිත වන්නේ බුදුන් වහන්සේ සංඝ සංස්ථාව අරඹයා අනුදැන වදාළ ක්‍රමවේදයට සමානවූ, සියලු දෙනාගේම එකඟතාවයෙන් පාලකයා සහ පාලන තන්ත්‍රය තෝරා පත් කර ගත හැකි වඩා පුළුල් ප්‍රජාතන්ත්‍රවාදයක් (ජනසම්මතවාදය නැතහොත් මහාසම්මතවාදය) බවත් අප අවධාරණය කර සිටින අතර ඡන්දයෙන් අගතියට පත් ජනතාවක් නෛසර්ගයෙන්ම නිර්මාණය කරන පවතින පක්ෂ දේශපාලන සහ ඡන්ද ක්‍රමවේදයන් බෞද්ධ රටකට කිසිසේත්ම නොගැළපෙන බවද අප තරයේ විශ්වාස කරමු.

- ✓ ඒ නිසා මේ බටහිර පක්ෂ දේශපාලන ක්‍රමවේදය තුළින් නිර්මාණය වී ඇති දෙවන පෙළ ජාතිවාදයත් (ශ්‍රී ලංකා ජාතිය, යූ.එන්පී. ජාතිය, පොහොට්ටු ජාතිය, මාලිමා ජාතිය, ස.ජ.බ ජාතිය, සර්වජන ජාතිය, පෙරටුගාමී ජාතිය ආදි වශයෙන් සිංහල බෞද්ධ ජන සමාජය තුළ ඉතා සූක්ෂම බෙදුම් රේඛා ඇති කිරීම), එම බෙදා වෙන්කර පාලනය කිරීමේ ක්‍රමය තවදුරටත් පවත්වාගෙන යාම තුළින් සමස්ථ ශ්‍රී ලාංකීය සමාජයටම අත්විය හැකි ඛේදජනක ඉරණමත් මඟ හරවා ගැනීම සඳහා, දස රාජ ධර්මය වැනි බුදු දහමේ සඳහන් ඉගැන්වීම් මත ගොඩ නැඟුණු, අපගේ ඓතිහාසික සිංහල බෞද්ධ සභ්‍යත්වයේ එන වටිනාකම් හා ගැළපෙන, දළදා වහන්සේ මුල් කරගත්, නව ස්වදේශීය පාලන ක්‍රමවේදයක් හඳුන්වාදීම කාලීන අවශ්‍යතාවයක් බව අප අවධාරණය කර සිටිමු. ඒ තුළින් උතුම් මනුෂ්‍යත්වයේ නාමයෙන් සියලු ජනවර්ග සහ ලබ්ධිකයන් සහෝදරත්වයෙන් එකතු කල හැකි ආධ්‍යාත්මික දේශපාලන ප්‍රවාහයක් මෙන්ම සංස්කෘතියක් මෙරට තුළ ගොඩ නැඟීමට අප කැපවී සිටිමු.

- ✓ තවද ඒ නව පාලන ක්‍රමවේදය, ජනතාව කෙරෙහි පාලකයන් තුළ ඇති වගකීම සහ වගවීම නීතියෙන් බලාත්මක කළ හැකි එකක් විය යුතු බවත්, එවැනි ක්‍රමවේදයක් නිර්මාණය කරගැනීම උදෙසා සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු යන පංච මහා බලවේග ප්‍රමුඛ කොටගත් අනෙකුත් දේශහිතෛෂී වෘත්තිකයන්, ව්‍යවසායකයන්, පූජකවරුන් ඇතුළු සමාජයේ සියළු ජන කොටස් නියෝජනය වන මහා ජන කතිකාවක් ඇරඹීමටත් අප කටයුතු කරන්නෙමු. එසේම ඒ නව පාලන ක්‍රමවේදය හරහා ඉදිවන සිංහල බෞද්ධ රාජ්‍යය මුළුල්ලේම පරිපාලන, අධිකරණ සහ මූලික අධ්‍යාපනයේ භාෂාව සිංහල විය යුතු බවත්, ශ්‍රී ලංකා රාජ්‍යය පුරා සිංහල බෞද්ධ සාම්ප්‍රදාය මත පදනම් වූ එකම ආණ්ඩුක්‍රම නීතියක්, පරිපාලන නීතියක්, පුද්ගල සහ දේපල නීතියක් ක්‍රියාත්මක කල යුතු බවත් අප අවධාරණය කර සිටිමු.

## 3. බෞද්ධ වටිනාකම් ප්‍රගුණ කළ හැකි තිරසාර ආර්ථිකයක උවමනාව

- ✓ මේ වන විට බටහිර ආර්ථික විශ්ලේෂකයන් විසින් බටහිර රටවල් අතළොස්සක් පසුගිය සියවස තුළදී ලද අසීමිත භෞතික දියුණුව සැබෑ දියුණුවක් නොවන බවත් එය මානව පරිණාමයේ මහා විකෘතියක් ලෙසත් අර්ථකතනය කරයි. මිනිසාගේ තෘෂ්ණාව අසීමිත වුවද සොබා දහමේ සම්පත් සීමිත බැවින් එවැනි දියුණුවක් ලෝකයේ අන් සියලුම රටවල් අත් පත් කර ගැනීම කිසිසේත්ම ප්‍රායෝගික නොවන බවද පෙන්වා දෙන ඔවුන් තවදුරටත් පවසන්නේ මෙම ධනවාදී වෙළඳපොළ ආර්ථික ක්‍රමය යටතේ සියලු දෙනාට සමාන අවස්ථාවක් හිමි නොවන බවයි. ඉතා ඉහළ දළ ජාතික නිෂ්පාදන දර්ශකයක් සහිත සීඝ්‍රයෙන් දියුණු වන රටවල පවා එම වැඩිවන නිෂ්පාදනයෙන් අතිමහත් බහුතරය පොහොසතුන් අතළොස්සක් අත රැඳී, ඉතිරි වන ඉතා සුළු ප්‍රතිශතය පමණක් බහුතර දුප්පත් ජනතාව අතර බෙදී යන බව ඔවුන් පෙන්වා දෙයි. ඒ නිසා පවතින ධනවාදී වෙළඳපොළ ආර්ථික ක්‍රමය තුළින් දුප්පතුන් තව තවත් දුප්පත් වී පොහොසතුන් තව තවත් පොහොසත් වීම හැර සැබෑ දියුණුවක් දැකිය නොහැකි බවත්, මේ හේතුවෙන් තුන්වන ලෝකයේ රටවල පවතින සමාජ,

ආර්ථික සහ දේශපාලනික ගැටළු ඒ ආකාරයෙන්ම දියුණු රටවලද ඇති බවත් ඔවුන් අවධාරණය කරයි. අපද මෙම ස්ථාවරය හා එකඟ වෙමු.

- ✓ තවද බටහිර ලෝකයේ නිර්මාණයවූ මෙම ආර්ථික වැඩපිළිවෙල ශ්‍රී ලාංකීය සභ්‍යත්වයට සහ එහි එන වටිනාකම් වලට කිසිසේත්ම නොගැළපෙන බව අපගේ විශ්වාසයයි. මෙම ධනවාදී වෙළඳපොළ ආර්ථිකය තුළින් නිර්මාණය කරන තෘෂ්ණාවෙන් සහ මමත්වයෙන් පිරි, ආත්මාර්ථකාමී, තරඟකාරී, අධිපරිභෝජනවාදී, අධිවේගී, අවිවේකී, අසහනකාරී මිනිසා සහ බුදු දහමෙන් පෝෂිත අපගේ සභ්‍යත්වයේ එන සරල, සැහැල්ලු, විවේකී, නිවුණු, අල්පේච්ඡ, පරාර්ථකාමී, සාමූහිකත්වය අගයන, නිරාමිස ප්‍රීතියෙන් යුත් මිනිසා අතර විශාල පරස්පරයක් තිබේ. ධනවාදී වෙළඳපොළ ආර්ථික ක්‍රමයක් තුළ සිටිමින් කිසිසේත්ම බෞද්ධ වටිනාකම් සහිත මිනිසකු නිර්මාණය කර ගත නොහැකි බවත්, අප බටහිරයන්ගෙන් නාමික නිදහස ලබා ගෙවුණු හැත්තෑ හත් වසරක කාලය මුළුල්ලේ බටහිර ක්‍රමය තුළින් අපේ අනන්‍යතාවය සෙවීමේ ප්‍රහල ආත්ම වංචාවක නිරත වී ඇති බවත් තරයේ අවධාරණය කර සිටිමු.

- ✓ ඒ නිසා අපගේ මුතුන් මිත්තන්ගේ ජීවන රටාව ආකෘති වශයෙන් ගනිමින්, ඒ මත පදනම්ව, වර්තමානයට ගැළපෙන පරිදි ප්‍රතිනිර්මාණය කරගත් තිරසාර බෞද්ධ ආර්ථික වැඩපිළිවෙලකට යොමු වීමත්, ඒ තුළින් අපගේ සභ්‍යත්වයේ එන වටිනාකම් ප්‍රගුණ කිරීමට රුකුල් දෙන, කෙලෙස් තවන, නිවනට උපනිශ්‍රය වන, විවේකී, සහනශීලි මෙන්ම ආර්ථික දියුණුව හෝ ලාභයට වඩා පුද්ගල ප්‍රවර්ධනයට ප්‍රමුඛතාවය දෙන සමාජයක් නිර්මාණය කරගැනීමත් අපගේ අරමුණයි. මෙම වැඩපිළිවෙල තුළ සෞඛ්‍ය සම්පන්න ආහාර පාන, ඇඳුම් පැළඳුම්, ඖෂධ සහ නිවාස යන ප්‍රධාන මිනිස් අවශ්‍යතාවයන්ගෙන් ස්වයංපෝෂිතවූ, සුරක්ෂිත රටක් නිර්මාණය කිරීමට මූලිකත්වය ලබා දෙන අතර කෘෂිකර්මාන්තය ශ්‍රී ලාංකීය ආර්ථිකයේ ප්‍රමුඛතාවය ලෙස සැලකේ. තවද රට තුළ ඇති ස්වභාවික සහ මානව සම්පත් වලට ප්‍රධානත්වය දෙමින් බැර කර්මාන්ත ආරක්ෂා කර වැඩි දියුණු කිරීමටත්, කුඩා, මධ්‍යම සහා ගෘහාශ්‍රිත කාර්මාන්ත ආරක්ෂා කරගැනීමටත් අප බලාපොරොත්තු වෙමු.

## 4. කෘතිමව නිර්මාණය කරන ලද ආර්ථික අර්බුදය සහ ඊට ඉක්මන් විසඳුම

- ✓ එසේම වර්තමාන ශ්‍රී ලංකාවේ සැබෑ ආර්ථික අර්බුදයක් නොමැති බවත් ඒ වෙනුවට ඇත්තේ ප්‍රධාන දේශපාලන පක්ෂ සහ ඒවායේ නායකයන් සියලු දෙනාගේම දැනුවත් කමින් යුතුව නිර්මාණය කරන ලද කෘතීම ආර්ථික අර්බුදයක් බවත් අප අවධාරණය කරන්නෙමු. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ න්‍යාය පත්‍රයට අනුව එම කෘතිම ආර්ථික අර්බුදය දිගින් දිගටම මෙරට තුළ පවත්වාගෙන යෑමේ අරමුණ වන්නේ එම අසරණභාවය උපයෝගී කරගනිමින් නොයෙකුත් අවාසිදායක අණ පනත්, ගිවිසුම් සහ ඒකාබද්ධකරණ වැඩපිළිවෙල වෙත ශ්‍රී ලංකා රජය බලහත්කාරයෙන් යොමු කොට, ක්‍රියාකාරීමය වශයෙන් දුර්වල කර අවසානයේ අපගේ මහපොළොව ඉතා සූක්ෂමව මංකොල්ලකෑම සඳහා ලෝක බලවතුන්ට ඉඩ ප්‍රස්ථාව සලසා දීමයි.

- ✓ එහෙයින් අපනයනකරුවන්ට සිය ඩොලර් ආදායම් පිටරට සැඟවීමට ඉඩ සලසා මේ වන විට ඇ.ඩො. බිලියන 55 කට අධික විදේශ විනිමය ප්‍රමාණයක් (මෙරට සමස්ථ විදේශ ණය ප්‍රමාණයට සමාන මුදලක්) රටට අහිමි කල 2017 විදේශ විනිමය පනතත්, මුදල් බලය සහ ආර්ථිකය සම්බන්ධ නීතී සෑදීමේ බලය ජනතාවගෙන් උදුරා ගෙන එය මහ බැංකු නිලධාරීන් කිහිපයක් අතට පත් කල 2023 මහ බැංකු පනතත් අහෝසි කර, පූර්වගාමීව පැවති පණත් බලවත් ප්‍රතිපාදන සහිතව යලි සම්මත කර රාජ්‍ය මූල්‍ය සහ විදේශ විනිමය අර්බුද විසඳීමට පදනම දැමීම උදෙසා අප කටයුතු කරමු.

- ✓ තවද අප ආර්ථික පරිවර්තන පණත, රාජ්‍ය මූල්‍ය කළමණාකරණ පනත සහ රාජ්‍ය ණය කළමනාකරණ පනත යන ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඒකාධිකාරයට යටත් කරන පනත් ත්‍රිත්වය අහෝසි කිරීම සඳහා හඬ නගන්නෙමු. එමන්ම ඉන්දියානු සාගර කලාපයේ භූදේශපාලන තත්වය සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකාවේ සියලු ආර්ථික, දේශපාලනික සහ ආරක්ෂක මර්මස්ථාන වල සම්පූර්ණ අයිතිය රාජ්‍යය සතු විය යුතු බවට තරයේ විශ්වාස කරන අප මෙරට තුල සියලු රජයන් යටතේ දිගින් දිගටම සිදුවෙමින් පවතින රාජ්‍ය දේපළ පෞද්ගලිකරණය සහ රාජ්‍ය ආරක්ෂාව අනතුරේ හෙළමින් ආර්ථික, දේශපාලනික හා ආරක්ෂක මර්මස්ථාන විදේශ සමාගම් වලට විකිණීමේ ක්‍රියාවලිය අත්හිටුවීම උදෙසාද කටයුතු කරන්නෙමු.

## 5. ආහාර සුරක්ෂිතභාවය සහ වස විසෙන් තොර දේශීය ආහාර රටාවකට පුරුදු වීම

- ✓ අප ආහාර සුරක්ෂිතභාවය, ආහාර සුලභ බව සහ සෞඛ්‍ය සම්පන්න ආහාර ජන ජීවිතයේ ප්‍රමුඛතාවයක් ලෙස සලකමු. එනිසාම දේශීය පරිභෝජනය සඳහා අවශ්‍ය සියලුම මූලික ආහාර වර්ග ස්වදෙශිකව නිෂ්පාදනය සහ සපයා ගැනීම කළ යුතු බව අප අවධාරණය කර සිටිමු. එමෙන්ම ශ්‍රී ලංකාව තුළ දිනෙන්

දින ඉහළ යන වකුගඩු සහ පිළිකා රෝග වලට ප්‍රධානතම හේතුව වශයෙන් තහවුරු වී ඇති කෘමි නාශක, වල් නාශක සහ රසායනික පොහොර ඇතුළු වගා සඳහා අසීමාන්තිකව එකතු කරනු ලබන අනෙකුත් කෘතීම වස විස වර්ග භාවිතය අවම කිරීම උදෙසා අතීතයේ අප සතුව තිබූ දේශීය කෘෂි ඥාණය යළි ප්‍රචලිත කිරීමටත්, වස විස භාවිතයකින් තොරව වගා කළ හැකි, වඩා වැඩි ඔරොත්තු දෙන ගුණයකින් යුත් දේශීය වී ඇතුළු අනෙකුත් බව භෝග වර්ග යළි හඳුන්වා දීමටත් අප බලාපොරොත්තු වෙමු. තවද දීපව්‍යාප්ත දැනුවත් කිරීමේ වැඩසටහන් හරහා ශ්‍රී ලාංකීය ජනතාව තුළ සෞඛ්‍ය සම්පන්න දේශීය ආහාර පාන තෝරා ගැනීම සඳහා අවශ්‍ය ආකල්පමය පරිවර්තනයක් පළමුව සිදු කොට, එහි දීර්ඝ කාලීන ප්‍රතිඵලයක් වශයෙන් දේශීය සහල් ප්‍රභේද ඇතුළු අනෙකුත් භෝග වර්ග වලට වෙළඳපොල තුළ නිර්මාණය වන නව ඉල්ලුම මත පදනම්ව, ගොවීන් විසින් වගාව සඳහා තෝරා ගන්නා වී වර්ග ඇතුළු බව භෝග වල ක්‍රමික ප්‍රතිපරිවර්තනයක් සිදු කිරීමටද අප බලාපොරොත්තු වෙමු.

## 6. නැණ නුවණ නොව ගුණ නුවණ වඩවන ස්වදේශීය අධ්‍යාපන ක්‍රමවේදයක ඇරඹුම

- ✓ මෙරට අධ්‍යාපන ක්‍රමවේදය ස්වදේශීය දැනුම මත පදනම් විය යුතු අතර ඒ තුලින් බෞද්ධ වටිනාකම් වලටත් දේශීයත්වයටත් ප්‍රමුඛත්වය ලබා දිය යුතු බව අප පිළිගනිමු. වත්මන් සමාජය වසාගෙන සිටින පිළිලයක් බඳු අනුකාරක, පරගැති, බටහිර මානසිකත්වයෙන් මිදුණු මතු පරපුරක් බිහි කරගැනීම සඳහා අපගේ අධ්‍යාපන ක්‍රමවේදය මඟින් බෞද්ධ ඉගැන්වීම්, හර පද්ධති, පුරුෂාර්ථ මෙන්ම අපගේ භාෂාව, ඉතිහාසය, සංස්කෘතිය, කලාව, ආහාර රටාව සහ ඇඳුම් පැළඳුම් විලාසිතා ආදිය උත්කර්ෂත්වයට නඟා ප්‍රවර්ධනය කළ යුතු අතර, දේශීය අධ්‍යාපන රටාව නූතන ලෝකයට ගැලපෙන පරිදි යාවත්කාලීන කර, ප්‍රතිනිර්මාණය කර ගත යුතු බවත්, විරල මනුෂ්‍ය ජීවිතයක පරම අරමුණ නිවනේ පරිචය සකසා ගැනීම බව මනාව අවබෝධ වූ ආධ්‍යාත්මික සමාජයක් බිහිකිරීම මේ සමස්ථ ක්‍රියාවලියේම අවසාන ඉල්ලකය විය යුතු බවත් අප පිළිගනිමු.

## 7. කූඨ ගිවිසුම් හරහා අහිමි වන ජාතික ස්වෛරීත්වය රැක ගැනීම

- ✓ ශ්‍රී ලංකාව ඇක්සා (ACSA), සෝෆා (SOFA) වැනි ආරක්ෂක ගිවිසුම් හරහා ඇමරිකානු හමුදාවන්ට සේවා සපයන දාස රාජ්‍යයක් බවට පත් කිරීමේ බටහිර මෙහෙයුමත්, ඉන්දියාව සමඟ මෑතකදී අත්සන් කරන ලද ආරක්ෂක ගිවිසුම හේතුවෙන් ශ්‍රී ලංකාවේ ස්වාධීනත්වය සහ ස්වෛරීත්වය ඉතාම බරපතල ලෙස තර්ජනයට ලක් කිරීමත්, ඒ හරහා ආසියාවේ නේටෝව ලෙස හැඳින්වෙන ක්වෝඩ් (QUAD - Quadrilateral Security Dialogue) ආරක්ෂක සන්ධානය සමඟ ශ්‍රී ලංකාව වක්‍රාකාරයෙන් ගැට ගසා අනාගතයේදී ලෝක බලවතුන් අතර ඇතිවිය හැකි යුධමය තත්වයකදී නිෂ්ක්‍රිය, සාම සාධක භූමිකාවක් රඟ දැක්වීමට තිබූ අවස්ථාව අහිමි කිරීමත්, එම බේදවාචකය අභියසදී පවතින සියලු දේශපාලන දහරාවන් සහ ඒවායේ නායකයන් සියලු දෙනාගේ ජුගුප්සාජනක නිහඬතාවයත් අප දැඩි සේ හෙළා දකිමු.
- ✓ අප ජාතික භෞතික සැලැස්ම ප්‍රතිපත්තිය තුළින් ඉතාම සූක්ෂමව ක්‍රියාත්මක වන බෙදුම්වාදී එම්.සී.සී. වැඩපිළිවෙල සහ ඒ ඔස්සේ ඉදිවෙමින් පවතින ශ්‍රී ලංකාවේ උතුර සහ දකුණ වෙන් කරන ආර්ථික කොරිඩෝව යථාර්තයක් කිරීමේ පූර්ව අවශ්‍යතාවයන් වන උරුමය ව්‍යාපෘතිය හරහා ඉඩම් කට්ටි බෙදා දීම, ඔප්පු ඩිජිටල්කරණය, ඉඩම් බැංකු ස්ථාපිත කිරීම සහ එමඟින් බහුජාතික සමාගම් ප්‍රමුඛ ගෝලීය බලවතුන්ට අපගේ භූමිය කොල්ලකෑම සඳහා ඉඩ සැලසීමට එකහෙළා විරුද්ධ වෙමු. එමෙන්ම ඊට අනුපූරක වශයෙන් ඉතා සූක්ෂමව ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය තුළ සිංගප්පූරුව විසින් ආරම්භ කර තිබෙන නැගෙනහිර දොරටුව ව්‍යාපෘතිය, ත්‍රිකුණාමලය මූලික කරගනිමින් ඉන්දියාව, ශ්‍රී ලංකාව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය යන රටවල් තුනෙහි සහයෝගීතාවයෙන් ගොඩනැගෙන ත්‍රෛපාර්ශ්වික බලශක්ති මධ්‍යස්ථානය සහ කොළඹ වරාය තුළ ඉන්දියානු මැදිහත්වීමෙන් ඉදිවන බටහිර ජැටිය ව්‍යාපෘතිය යන ප්‍රධාන සන්ධිස්ථාන ව්‍යාපෘති සියල්ල ඇතුළු කූඨ එම්.සී.සී. මර උගුලට අයත් අනෙකුත් සියලු ප්‍රත්‍යන්ත ව්‍යාපෘති වලට විරුද්ධවද අප සෘජුව මැදිහත් වන්නෙමු.
- ✓ මුදල් ඒකාබද්ධකරණය යටතේ ඉන්දීය රුපියල ශ්‍රී ලංකා වෙළඳපොල තුළ භාවිතයට ඉඩ දීම, රේගු එකාබද්ධකරණය මඟින් ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර රේගු ඒකාබද්ධ කර දෙරට අතර භාණ්ඩ හුවමාරුවේදී සියලු බදු අවලංගු කිරීම, මූල්‍ය සහ බදු පද්ධති ඒකාබද්ධකරණය (fiscal and custom merger) තුළින් ඉන්දියනුවන්ට ශ්‍රී ලාංකිකයන් සේ සැලකීම, වරාය සහ ගුවන් තොටුපොළ ඒකාබද්ධකරණය හරහා ශ්‍රී ලංකාවේ සියලු වරායන් සහ ගුවන් තොටුපොළ ආශ්‍රිත මෙහෙයුම් සඳහා ඉන්දියාවට ඒකාධිකාරයක් අත් කරදීම, අපගේ බලශක්ති ස්වාධිපත්‍යය අහිමි කරන බලශක්ති ඒකාබද්ධකරණ වැඩපිළිවෙල යටතේ දෙරට අතර විදුලි පද්ධති සම්බන්ධ කිරීම සහ සාගර පත්ල හරහා ඉන්දියාවේ සිට ශ්‍රී ලංකාවට තෙල් නලයක් එළීම, භූගෝලීය ඒකාබද්කරණය හෙවත් ආදම්ගේ පාලම හරහා ඉන්දියාවත් ශ්‍රී ලංකාවත් භෞතිකව යා කිරීම සහ ඉන්දියාවේ දනුෂ්කොඩි සිට ශ්‍රී ලංකාවේ ත්‍රිකුණාමලය දක්වා ජාත්‍යන්තර දුම්රිය මාර්ගයක් ඉදිකිරීම

යන ඉන්දියාව සමඟ එකඟ වී ඇති සයවිධ ඒකාබද්ධකරණ වැඩපිළිවෙල හරහා ශ්‍රී ලංකාවේ ස්වෛරීත්වය තර්ජනයට ලක් කිරීමට විරුද්ධව අප සෘජුව මැදිහත් වන්නෙමු.

✓ ඉන්දියාවේ පස්වන හමුදාව නමින් විරුදාවලිය ලත් ඉන්දීය ශ්‍රමික සහ ව්‍යවසායක කාඩරයේ ග්‍රහණයට ශ්‍රී ලංකාවේ රැකියා සහ සාමාන්‍ය වෙළඳපොළ නතු කිරීමෙන් නොනැවතී ඉන්දීය රෝ ඔත්තු සංවිධානයේ සාමාජිකයන්ට ශ්‍රී ලංකාවේ සියලු ක්ෂේත්‍ර තුළ රැකියා අවස්ථා අත් පත් කර ගනිමින් උපායමාර්ගිකව ස්ථානගත වීමට ඉඩ හසර විවර කරන යෝජිත එට්කා (ETCA) ගිවිසුමට අප එක හෙළා විරුද්ධ වෙමු. ඒ හරහා ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාවට සිදුවන තර්ජනය පමණක් නොව අපගේ ආර්ථිකය මහා පරිමාන ඉන්දියානු සමාගම් අතට පත්වීම සහ ශ්‍රී ලාංකිකයන්ට මෙරට තුළ සියලු රැකියා අවස්ථා අහිමි වීම වැනි කාරණා පිළිබඳව දීපව්‍යාප්තව මහජනතාව දැනුවත් කිරීමටද අප බලාපොරොත්තු වෙමු.

✓ දත්ත හැසිරවීම තුළින් ඉතා පහසුවෙන් ආණ්ඩු මාරු කිරීම, රාජ්‍යයන් තුළ අභ්‍යන්තර කල කෝළාහල නිර්මාණය කිරීම, යුධ ගැටුම් ඇති කිරීම සහ ආර්ථිකයන් කඩා වැට්ටවීම සිදු කළ හැකි අවධියක ඩිජිටල් හැඳුනුම්පත් හඳුන්වාදීමේ ව්‍යාපෘතිය යටතේ සියලු ශ්‍රී ලාංකිකයන්ගේ අතිශයින්ම සංවේදී ජෛවමිතික (Biometric) දත්ත ඉන්දියානු සමාගමක් අතට පත් කරන ඩිජිටල්කරණ ගිවිසුම සහ අවාසිදායක ද්වී පාර්ශවික වෙළඳ ගිවිසුම් ඇතුළු අනෙකුත් අගතිදායි ගිවිසුම් සියල්ල තුලින් අපගේ මාතෘභූමිය පරිපාලනමය වශයෙන් අකර්මන්‍ය කර, දුර්වල කර ඉන්දියාවේ විසි නවවන ප්‍රාන්තය බවට පත්කොට සිබිමය මුහුණ දුන් ඉරණම අත්වන්නට අප කිසිසේත් ඉඩ නොතබන්නෙමු.

## 8. සංස්කෘතික ආක්‍රමණය තුළින් මහපොළොව මංකොල්ල කෑමට ඉඩ නොතැබීම

✓ බුදු දහම මත පදනම්වූ ශ්‍රී ලංකාවේ ඓතිහාසික සභ්‍යත්වය කෙලෙසමින්, අපගේ සංස්කෘතික මූලයන් විනාශ කරන දමන, සංඝ සමාජය පරිහානියට පත් කිරීම, ගණිකා වෘත්තිය, ගබ්සාව, සමලිංගික සේවනය හා සංක්‍රාන්ති ලිංගික චර්යාවන් නීතිගත කිරීම හරහා පවුල නැමැති ඓතිහාසික සංස්ථාව බිඳ දැමීම, සමාජය තුළ ප්‍රචණ්ඩත්වය වැපිරීම සහ අපගේ තාරුණ්‍යය දෘෂ්ඨිමය වශයෙන් බිඳ වැට්ටවීම යන චතුර්විධ සංස්කෘතික ආක්‍රමණයන්ට මෙන්ම එම ආක්‍රමණයේම තවත් දිගුවක් වන, සියලු දේශපාලන පක්ෂවල ආශීර්වාදය ලත් Sri Ramayan Trails ව්‍යාපෘතිය හරහා සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනයේ නාමයෙන් රාම රාවණ ඉතිහාසය හා සම්බන්ධ ස්ථාන නමයක බෞද්ධ අටමස්ථාන වලට විකල්පයක් වශයෙන් හින්දු නමමස්ථානයක් ඉදිකිරීමත්, ඒ හරහා භාරතය සමඟ ශ්‍රී ලංකාව සංස්කෘතිකව ඒකාබද්ධකරණය කර ලංකාවාසී බෞද්ධයන්ගේ මහා විහාර සම්ප්‍රදාය යටපත් කිරීමේ කූඨ වැඩපිළිවෙළත් පරාජය කිරීම සඳහා අප ඇප කැප වී සිටිමු.

## 9. රණවිරු දඩයමට විරුද්ධව

✓ බටහිර භූදේශපාලනික උවමනාවන්ට පටහැනිව යමින් යුද්ධය අවසාන කිරීමට පළිගැනීමක් වශයෙන් හතර වන ඊළාම් යුද්ධයෙන් ශ්‍රී ලංකාව ආරක්ෂා කර යලි එක්සේසත් කිරීමට දායක වුනු ත්‍රිවිධ හමුදා නිලධාරීන් මෙන්ම, එම යුධ ක්‍රියාන්විතයට දේශපාලන නායකත්වය දුන් එවකට පාලකයන් හා පරිපාලන නිලධාරීන්, ඊනියා සත්‍ය සෙවීමේ සහ යුධ අපරාධ වලට දඬුවම් පැමිණවීමේ නාමයෙන් දඩයම් කිරීම උදෙසාම ගෙන එන ලද සත්‍ය සහ ප්‍රතිසංධාන කොමිෂන් සභා පනතටත්, එය යම් හෙයකින් පාර්ලිමේන්තුව තුළ සම්මත වුවහොත් ක්‍රියාත්මක වන දේශීය යුධ අපරාධ මහාධිකරණ යාන්ත්‍රණය මෙන්ම ඉන් පාර කැපෙන ජාත්‍යන්තර අතපෙවීමටද අප විරුද්ධව වැඩ කරමු. එමෙන්ම යුද්ධයේදී මියගිය සහ අබාධිතවූ රණවිරුවන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල අයට ලබා දිය යුතු සියලු දීමනා සහ අනෙකුත් පහසුකම් යලි ප්‍රතිස්ථාපනය කිරීම උදෙසා කටයුතු කරමු.

## 10. දේශීය වෙදකම මර්ධනය, වසංගත ජාවාරම සහ බලහත්කාරයෙන් එන්නත් කිරීමට එරෙහිව

✓ ශ්‍රී ලංකාවේ දේශීය වෙදකම ආරක්ෂා කොට ප්‍රවර්ධනය කිරීම සහ එම පාරම්පරික ඖෂධ හා වෛද්‍යක්‍රම නූතන ජීවන රටාවන්ට ගැළපෙන පරිදි හැඩගසා ප්‍රතිනිර්මාණය කර ගැනීම සඳහාද අප කටයුතු කරන්නෙමු. එමෙන්ම ශ්‍රී ලංකාව තුළ ගෝලීය වසංගත ඇතුළු අනෙකුත් ඕනෑම හදිසි සෞඛ්‍ය තත්වයකදී තම අභිමතය පරිදි සුදුසු යැයි සැලකෙන දේශීය හෝ බටහිර ප්‍රතිකාර ක්‍රමවේදයක් තෝරාගැනීමේ මානව අයිතිවාසිකම සහ පුරවැසි නිදහස වෙනුවෙන් අප කොන්දේසි විරහිතව පෙනී සිටිමු.

✓ ශ්‍රී ලංකාව 2025 දී ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් යෝජනා කරන ලද වසංගත සඳහා පෙර සූදානම් වීමේ සම්මුතිය වෙත එළැඹීමට විරුද්ධව අප සෘජුව මැදිහත් වන්නෙමු. මෙම සම්මුතිය බටහිර සෞඛ්‍ය මාෆියාව

විසින් නිර්මාණය කරන ලද ගෝලීය වසංගත ජාවාරම නීතියෙන් බලාත්මක කිරීමේ මූලික පියවරක් වශයෙන් අප හඳුනාගෙන ඇති අතර, ඉදිරියේදී පැමිණිය හැකි යැයි අනුමාණ කෙරෙන ගෝලීය වසංගත තත්ව වලදී භාවිතා කිරීම සඳහා එන්නත්, පරීක්ෂණ කට්ටල සහ අනෙකුත් සෞඛ්‍යාරක්ෂක නිෂ්පාදන කල් තබා ඇනවුම් කිරීම වෙනුවෙන් වාර්ෂිකව විශාල මුදලක් වෙන් කිරීමට ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් එම සම්මුතියට අත්සන කරන ලද රටවලට සිදු කරන බලපෑම අප වැනි ආර්ථික වශයෙන් දුර්වල රටවල් තව තවත් දුර්මුඛ කිරීමටද, ජාත්‍යන්තර මූල්‍ය ආයතන වල ණය උගුල් වල තව තවත් සිර කිරීමටද ගන්නා උත්සහයක් ලෙස අප දකිමු.

- ✓ විශේෂයෙන්ම එම සම්මුතිය තුළ සඳහන්, 2026 වසරේ සිට බලාත්මක වන 'එක් සෞඛ්‍යයක් ප්‍රවේශය' මඟින් කෘතිමව නිර්මාණය කරන ලද ගෝලීය වසංගත තත්වයන් උපයෝගී කරගනිමින් දේශීය ඖෂධ භාවිතය තහනම් කිරීම සහ බලහත්කාරයෙන් එන්නත් කිරීම ආදී ක්‍රියා මාර්ග තුළින් ගෝලීය ධනවතුන්ගේ ජනගහන පාලන න්‍යාය පත්‍රය ක්‍රියාවට නැංවීම, තුන්වෙනි ලෝකයේ රටවල ජනතාව කිසිඳු අනුදැනුමකින් තොරව විවිධ වෛද්‍ය විද්‍යාත්මක පර්යේෂණ සඳහා යොදා ගැනීම සහ බටහිර සෞඛ්‍ය මාෆියාවේ දීර්ඝ කාලීන උවමනාවන් මුදුන් පත් කරගැනීම සඳහා, ඉතාම සූක්ෂමව සහ සැලසුම් සහගතව ස්වදේශීය වෛද්‍ය ක්‍රමවේද සීමා කොට, යටපත් කර දමා, අභාවයට යැවීමේ කූට වැඩපිළිවෙලටද අප සම්පූර්ණයෙන්ම විරුද්ධ වෙමු.

## 11. වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම නොබැඳි මෙන්ම නිදහස් විදෙස් ප්‍රතිපත්තියක්

- ✓ දේශපාලන, ආර්ථික සහ ආරක්ෂක කටයුතු සම්බන්ධයෙන් ලෝකයේ අනෙකුත් රටවල් සමඟ ගණුදෙනු කිරීමේදී නොබැඳි මෙන්ම නිදහස් විදෙස් ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමත්, ඉන්දියානු සාගර කලාපය නිරවි කලාපයක් වශයෙන් පවත්වාගෙන යෑම සඳහා හැකි සෑම අවස්ථාවකදීම ජාත්‍යන්තර වේදිකාව තුළ සාම සාධක භූමිකාවක් ඉටු කිරීමත්, කිසිඳු ලෝක බලවතෙකුගේ හවුල් කරුවකු බවට පත් නොවෙමින් ඒක ධ්‍රැවික ලෝකයක් වෙනුවට බහු ධ්‍රැවික ලෝකයක් වෙනුවෙන් පෙනී සිටීමත්, ඒ හරහා ශ්‍රී ලංකාවේ අභිලාෂයන්ට ප්‍රමුඛතාවය ලබා දෙමින් එම අවශ්‍යතාවයන් අනුව ක්‍රියාත්මක වීමේ අවකාශය නිර්මාණය කරගැනීමටත් අප බලාපොරොත්තු වෙමු.